www.AlevelApi.com

AL/2019/28/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

2019.08.24 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

**1.** (i) වර්ණවල ගුණාංග **දෙකක්** නම් කර, ඒවා හඳුන්වන්න.

(ii) ගෘහීය විද්‍යුත් උපකරණයක් නම් කර එහි සිදුවන ශක්ති විපර්යාසය සඳහන් කරන්න.

(iii) ස්ථූලතාව ඇතිවීම සඳහා බලපාන ආහාරමය නොවන හේතු **දෙකක්** දක්වන්න.

(iv) දියවැඩියා රෝගයෙහි සංකූලතා **දෙකක්** සඳහන් කරන්න.

(v) ෆෙල්ට් කිරීම (felting) යනු කුමක් ද?

(vi) තිර රාමු මුද්‍රණය හඳුන්වන්න.

(vii) මානව පාලිත සංචාරක ආකර්ෂණය සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න.

(viii) 'ආහාර පා සළකුණු' (Food foot print) හඳුන්වන්න.

(ix) සන්නිවේදනයට ඇති බාධා **දෙකක්** සඳහන් කරන්න.

(x) දරුවකුගේ මානසික නීරෝගීතාව සඳහා බලපාන සාධක **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 10 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** (i) නිර්මාණකරණයේ මූලික සාධක **තුනක්** නම් කර, ඒවා හඳුන්වන්න. (ලකුණු 03 යි)

(ii) ගොඩනැගිල්ලක් ආලෝකකරණයේ දී සැලකිය යුතු කරුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iii) ගෘහ පරිසරයක ඇතුළත් උපාංග **තුනක්** නම් කර ඉන් **දෙකක** කෘත්‍ය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) අපජලය උත්පාදනය වන ප්‍රධාන මූලාශ්‍ර නම් කර ඒවායින් ජනනය වන අපද්‍රව්‍ය බැහැර කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

**3.** (i) බොජුන් පතක් සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) අවුරුදු 1-5 තෙක් දරුවකුගේ විශේෂ පෝෂණ අවශ්‍යතා සඳහන් කර, ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත සඳහන් කරන ලද පෝෂක **දෙකක්** නිසි පරිදි නොලැබීමෙන් අවුරුදු 1-5 දරුවන් පිළිබිඹු කරන ඌනතා රෝග ලක්ෂණ වෙන් වෙන් ව දක්වන්න. (ලකුණු 04 යි)

(iv) වයස අවුරුදු හතරක දරුවකුගේ දිවා ආහාර වේල සඳහා බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

4. (i) සුබීකරණය (බ්ලාන්චිකරණය) පරිරක්ෂණ ක්‍රමවල දී පූර්ව ප්‍රතිකාරයක් ලෙස යොදා ගනියි. සුබීකරණයෙහි වැදගත්කම සනාථ කිරීමට කරුණු **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

(ii) රසායනික පරිරක්ෂණකාරක භාවිත කිරීමේ දී නියමිත මාත්‍රාව පමණක් ආහාරයට එකතු කිරීම ඉතා වැදගත් ය. මෙම කාරක අධික ලෙස ශරීරගත වීම නිසා ඇතිවිය හැකි හානිකර තත්ත්ව මොනවා ද? (ලකුණු 03 යි)

(iii) ආහාර පරිරක්ෂණයේ දී යොදා ගන්නා යාන්ත්‍රික විජලීමෙහි විවිධ ක්‍රම විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iv) (*a*) ආහාර ඇසුරුමක තිබිය යුතු ගුණාංග සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(*b*) පරිරක්ෂිත ආහාර ඇසුරුම් කිරීමේ ව්‍යාපාරයක් ඇරඹීමට ප්‍රථම 'ශදූඅත' (SWOT) විශ්ලේෂණය සිදු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(මුළු ලකුණු 16 යි)

5. (i) වාණිජ මැහුම් ක්‍රමවල පෙනුම සහ කල්පැවැත්මට බලපාන සාධක **තුනක්** නම් කර ඒවා හඳුන්වන්න. (ලකුණු 03 යි)

(ii) ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයෙහි වැදගත්කම කරුණු **හතරක්** ඇසුරෙන් පහදන්න. (ලකුණු 04 යි)

(iii) මේස දරණුවක් මසා නිම කිරීම සඳහා බඳන වාටියක් (binding) යොදා ගන්නා අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) ඇඟලුම් කර්මාන්තයෙහි නිෂ්පාදන සඳහා 'පිරිසැලසුම' (product development) නිර්මාණය කරයි. පිරිසැලසුමෙහි ඇතුළත් පියවර විස්තර කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

6. (i) 'තිරසාර සම්පත් පරිභෝජනය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) තිරසාර සම්පත් පරිභෝජනයෙහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) සංචරණයේ ප්‍රභේද **හතරක්** නම් කර ඉන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) සංචරණයෙහි නිරත වන පුද්ගලයකුට අත්වන ප්‍රතිලාභ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(මුළු ලකුණු 16 යි)

7. (i) නව යොවුන් වියෙහි චිත්තවේග වර්ධනයේ ස්වභාවය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 03 යි)

(ii) නව යෞවනයා මුහුණදෙන පවුල හා සමාජය ආශ්‍රිත ගැටළු ඉදිරිපත් කරන්න. (ලකුණු 03 යි)

(iii) 'සමහර යොවුන් දරුවන් තුළ ඇතිවන මානසික පීඩනය (stress) කායිකව මෙන්ම චිත්තවේගීව පිළිබිඹු කරයි.' උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) යොවුන් දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා පාසලෙහි දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

8. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව සටහන් ලියන්න.

(i) බාහිර අවකාශ නිර්මාණයේ දී උපාංග භාවිතය

(ii) දෛනික ආහාරවේල්වලට තන්තු ඇතුළත් කිරීමේ වැදගත්කම

(iii) නිමි ඇඳුම් සඳහා යොදනු ලබන නිමාවන්

(iv) සංචරණය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති වූ ධනාත්මක හා ඍණාත්මක බලපෑම්

(v) පුද්ගලයකුගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන ජානමය ලක්ෂණ

(ලකුණු 04 × 4 යි)

(මුළු ලකුණු 16 යි)

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.